# ලංකා විදුලිබල මණ්ඩලය

## ටෙන්ඩර් දැන්වීම

## ඉඩමක් මිලදී ගැනීම - කොටදෙනියාව

ග්‍රිඩ් උපපොලක් ඉදිකිරීම සඳහා අක්කර 08ක පමණ වපසරියක් ඇති ඉඩමක් මැල්ලවගෙදර, බඩල්ගම ප්‍රදේශය තුල හෝ කි. මී. 2කට පමණ ආසන්න ප්‍රදේශ වලින් මිලදී ගැනීමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

මෙම වපසරිය ලබා ගැනීමට එක ළඟ පිහිටි කුඩා ඉඩම් ද අයිතිකරුවන් එකඟව හා සාමූහිකව ඉදිරිපත් කළ හැකිය. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම්ව ඉඩම් කොටසෙහි මිල ලංකා විදුලිබල මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

අදාළ ඉඩම නිරවුල්, මතුපිට ගල් රහිත, වගුරු බිම් නොවන හා ගංවතුර තර්ජන රහිත එකක් විය යුතුය. තවද එම ඉඩම අවම අඩි 30ක ප්‍රවේශ මාර්ගයක් සහිත විය යුතු අතර ජනාකීර්ණ නොවන ප්‍රදේශයක පිහිටා තිබිය යුතුය. කුඹුරු ඉඩම් වලට යාබදව පිහිටා ඇත්නම් වඩා යෝග්‍ය වේ.

2020 මාර්තු 27 දිනට පෙර මුද්‍රා තබන ලද මිල ගණන් "ඉඩමක් මිලදී ගැනීම - කොටදෙනියාව" යනුවෙන් ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරෙහි සඳහන් කර පහත සඳහන් විස්තරද සහිතව ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

අවශ්‍ය විස්තර:

1. අයිතිකරුගේ නම, ලිපිනය හා දුරකථන අංකය
2. ඉඩමට පිවිසෙන මාර්ගයේ විස්තර
3. ඉඩමේ වපසරිය හා විකිණීමට බලාපොරොත්තු වන මුදල
4. ඔප්පුවෙහි හා පිඹුරෙහි පිටපත්

අරමුණු කළමණාකරු කාර්යාලය (PSRSP P – 1),
3 වන මහළ, 65/1, ර. නි. ය. ස. ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02
දුරකථන අංකය - 0112 343 934/ 0112 422 968

අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති)

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD